# දැන්වීමයි

# හෝමියෝපති වෛද්‍ය සභාව

# පුරප්පාඩු

හෝමියෝපති වෛද්‍ය සභාවේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

පුරප්පාඩු - 01

පත්වීමේ ස්වභාවය : ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

වැටුප් ක්‍රමය : සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA1-1-2025- (රු.46220-10X540-7X630-4X890-20X1190- 83390)

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යාපන : (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I සිංහල / දෙමළ

II ගණිතය

III ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :

පරිගණක වදන් සැකසුම පිළිබඳ මූලික දැනුම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය/ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ

II. ගණිතය

III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර ඉන් විෂයයන් තුනකටවත් සම්මාන සාමාර්ථ තිබිය යුතුය.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකම් වශයෙන් සලකා බලනු ඇත.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් :**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :** තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

**සැ.යු.-** ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි **"කළමනාකරණ සහකාර තනතුර සඳහා අයදුම් කිරීම"** ලෙස දැක්විය යුතුයි.

**ලේඛකාධිකාරී (වැ.බ.),**
**හෝමියෝපති වෛද්‍ය සභාව,**
**අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,**
**වැලිසර, රාගම.**

**02. තනතුර : කාර්යාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)**

**පුරප්පාඩු - 04**

**පත්වීමේ ස්වභාවය :** ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

**වැටුප් ක්‍රමය** : සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

PL1 - 2025 (රු.40,500-10X450-10X490-7X540-15X590- 62,530)

**සුදුසුකම්**

**අධ්‍යාපන :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය යටත් පිරිසෙයින් විෂයන් දෙකකින් (02) සමත් වී තිබිය යුතුයි.

**වයස :**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

**වෙනත් :**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

iv. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

v. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

vi. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :** තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

**සැ.යු -** ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි **"කාර්යාල සහායක තනතුර සඳහා අයදුම් කිරීම"** ලෙස දැක්විය යුතුයි.

**ලේඛකාධිකාරී (වැ.බ.),**
**හෝමියෝපති වෛද්‍ය සභාව,**
**අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,**
**වැලිසර, රාගම.**

tamilguru.lk